**I පත්‍රය** - (ලකුණු 2 x 25 = 50)

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | 3 | 02 | 3 | 03 | 2 | 04 | 1 | 05 | 4 | 06 | 3 | 07 | 2 | 08 | 3 |
| 09 | 2 | 10 | 4 | 11 | 2 | 12 | 4 | 13 | 3 | 14 | 1 | 15 | 2 | 16 | 3 |
| 17 | 4 | 18 | 2 | 19 | 3 | 20 | 2 | 21 | 4 | 22 | 2 | 23 | 1 | 24 | 3 |
| 25 | 4 | | | | | | | | | | | | | | |

**II පත්‍රය**

01 (1) පවතින දේ පිළිබඳව විමසිලිමත් වෙමින් වෙනසක් කිරීමට උත්සාහ ගැනීම / අනාගතය ගැන අපේක්ෂා සහගත සිහිනයක් තිබීම / අලුත් අදහස් හා සංකල්ප ක්‍රියාවට නැංවීමට උත්සාහ ගැනීම / අඛණ්ඩව එම උත්සාහයේ නිරතව සිටීම / සාර්ථක ව්‍යාපාරයකට අඩිතාලම යොදා තිබීම / සමාජයේ යහපතට කටයුතු කරමින් හොඳ ජීවිතයක් ගතකිරීම. (දෙකකට ල. 02)

(2) නිර්මාණශීලීත්වය, නවෝත්පාදනය, අවදානම භාර ගැනීම, අනාගත දැක්ම, පරිසර සංවේදී බව හා අවස්ථා හඳුනාගැනීම, සුභවාදී වීම, ස්වකීය සාර්ථකත්වය තමා අනුව තීරණය වන බව විශ්වාස කිරීම, ස්වාධීනත්වය, නම්‍යශීලීත්වය (හතරකට ල. 02)

(3) ගැටලු හා අවස්ථා දෙස බලා ඒවාට විසඳුම් ලෙස නව අදහස් සංවර්ධනය කිරීමට හෝ නව මාර්ග සොයාගැනීමට ඇති හැකියාවයි. (ල. 02)

(4)

| ගැටලුව | ලබා ඇති විසඳුම් |
|---|---|
| ඉවත් කරන කළු පොලිතීන් | ප්‍රතිචක්‍රීයකරණය කර වාඩිවීමට බංකු සෑදීම (දරුවාගේ යෝජනා කරන විසඳුමට) |
| පැළ සඳහා යොදන ජලය ඉවත්ව යන වැඩි කොටස | ජලය වැඩිය අවශ්‍ය වන කොහිල, කන්කුන් වැනි භෝග වගාවට යොදාගැනීම (දරුවාගේ විසඳුමට) |

(ල. 04)

02 (1) දරුවා දක්වන ගැටලු හා එම ගැටලු 5 විසඳීමට උචිත විසඳුම් යෝජනාවට (ල. 05)

(2) (a) නව සොයාගැනීමක් - උදා: ඩිජිටල් කැමරාව, විදුලි බල්බය, ගුවන් යානය, විද්‍යුත් වෙළඳාම

(b) දිගුවක් - උදා: මේද රහිත කිරි, විද්‍යුත් ගෙවීම් ක්‍රම, විදුලි දුම්රිය, ස්මාර්ට් ජංගම දුරකථන, ස්වයං සේවා අලෙවිසැල්

(c) අනුකරණය කිරීමක් - අයිස්ක්‍රීම් බෙදාහැරීමේ ජංගම රථයේ ක්‍රමයට බේකරි නිස්පාදන බෙදාහැරීම

(d) සංකලන - උදා: LED විදුලි බල්බ යොදා වෙසක් තොරණ, හාල්පිටි භාවිතයෙන් බේකරි නිෂ්පාදන (ල. 04)

(3) අනපේක්ෂිත සිදුවීම්, ක්‍රියාවලි අවශ්‍යතා, වෙළඳපලේ වෙනස්වීම්, ප්‍රජා පරිසරය හා ජන ජීවිතයේ වන වෙනස්කම්, සංජානනය හෙවත් තේරුම් ගන්නා ආකාරය වෙනස්වීම්, දැනුම පදනම් කරගත් සංකල්ප (ල. 01)

03 (1) මිනිසාගේ ජීවිතය පවත්වාගෙන යෑමට අනිවාර්යයෙන්ම සපුරාගත යුතු දෑ අවශ්‍යතා වන අතර අවශ්‍යතා සපුරාගැනීමේ විවිධ ස්වරූප වුවමනා ලෙස හැඳින්වේ.

(2) <u>අවශ්‍යතා</u>

මූලිකව පැන නගියි / සීමිතය / සියලුදෙනාටම පොදුය / උප්පත්තියත් සමග ඇතිවේ

<u>වුවමනා</u>

අවශ්‍යතා මතුවූ පසු දෙවනුව පැන නගියි / එක් අවශ්‍යතාවක් ඉටුකර ගැනීමට වුවමනා රාශියක් ඇත / පුද්ගලයන්ගේ විවිධත්වය අනුව වුවමනා විවිධ වේ / අවශ්‍ය පරිදි නිර්මාණය කළ හැකිය

(3) භාණ්ඩ

ස්පෘශ්‍ය වේ, භෞතික පැවැත්මක් ඇත / ගබඩා කළ හැක / සමජාතීය බව ආරක්ෂා කළ හැකිය / පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියට අත්‍යාවශ්‍ය නොවේ / සපයන්නාගෙන් වෙන්කළ හැකිය

සේවා

අස්පෘශ්‍ය වේ, භෞතික පැවැත්මක් නැත / ගබඩා කළ නොහැක / සපයන පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ / පාරිභෝගිකයා නිෂ්පාදන ක්‍රියාවලියේ කොටසකි / සපයන්නාගෙන් වෙන් කළ නොහැකිය.

(4) අවශ්‍යතාවට සරිලන පරිදි වුවමනාවක් ලිවීමට (හතරකට)

(5) ව්‍යාපාරයේ සම්පත් ගනුදෙනුවල යෙදීම, ගනුදෙනු අඛණ්ඩව සිදුවීම, අරමුණක් පැවතීම, මිල මත ගනුදෙනු සිදුවීම, ආර්ථික කටයුත්තක් වීම (දෙකකට) (2 x 5 = 10)

04 (1) ආර්ථික කටයුත්තක යෙදීම, අවදානමකට මුහුණ දීම, ගනුදෙනුවල නිරත වීම, සම්පත් භාවිතය, තරගයට මුහුණ දීම, නිෂ්පාදන මිලදී ගැනුම් හා විකුණුම් සම්බන්ධ තීරණ ගැනීම, පැවැත්ම ගැන සිතීම, ස්වයං පෙළඹවීමක් තිබීම (හතරක්)

(2) <u>ව්‍යාපාරිකයා</u>
ව්‍යාපාර කටයුතුවල යෙදෙන්නේ ගතානුගතික හා සම්ප්‍රදායික ක්‍රමයකටය / අවදානම් භාරගැනීමට කැමති නොවේ / තරගයට මුහුණ දීමට කැමති නොවේ / පවතින සම්පත්වලින් වුවද උපරීම ප්‍රයෝජන නොගැනීම / ගතානුගතිකව ගැටලු විසඳීමට උත්සහ ගනී / ඉතා ආසන්න ඉලක්ක ඇතිකර ගනී / ව්‍යාපාරය තිබෙන තත්වයෙන්ම පවත්වා ගැනීමෙන් සෑහීමට පත්වේ.
<u>ව්‍යවසායකයා</u>
පරිසරයේ වෙනස්කම් සැලකිල්ලට ගෙන නිර්මාණශීලී නවෝත්පාදන පදනම් කරගෙන ව්‍යාපාර කටයුතුවල යෙදෙයි / අවදානම හොඳින් තක්සේරු කර දැරිය හැකි අවදානම භාරගනියි / තරගය කැමැත්තෙන් සොයා යයි / පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබයි / ගැටලු නිර්මාණශීලීව විසඳයි / දිගුකාලීන දැක්මක් සහිතව දූරදර්ශීව ඉලක්ක පිහිටුවයි / ව්‍යාපාරය දිනෙන් දින පුළුල් කර ගනියි

(3) ව්‍යාපාර ව්‍යවසායකයෝ, සමාජයීය ව්‍යවසායකයෝ සහ අභ්‍යන්තරික ව්‍යවසායකයෝ

(4) <u>ව්‍යාපාර ව්‍යවසායකයෝ</u>
සාමාන්‍යයෙන් ලාභ අපේක්ෂාවෙන් ව්‍යාපාර කටයුතුවල නිරතවන ව්‍යවසායකයෝ
<u>සමාජයීය ව්‍යවසායකයෝ</u>
සමාජයේ ප්‍රශ්නවලට නිර්මාණාත්මකව විසඳුම් ඉදිරිපත් කරන පුද්ගලයෝ
<u>අභ්‍යන්තරික (ආයතනික) ව්‍යවසායකයෝ</u>
ආයතනය තුළ ඉහළ තනතුරු දරන එමෙන්ම ව්‍යවසායකත්ව ගුණාංග ඇති පුද්ගලයෝ (එකක්)

(5)

| | එකඟවේ | එකඟ නොවේ | නිශ්චිතව කිව නොහැක |
|---|---|---|---|
| 1. | ✔ | | |
| 2. | ✔ | | |
| 3. | | ✔ | |
| 4. | ✔ | | |

(2 x 5 = 10)

05 (1) ස්වකීය දෛවය තමා මතම රඳා පැවතීම / කාර්යයන්හි විවිධත්වයක් ඇතිවීම / සමාජයීය සුභ සාධනය සඳහා දායක විය හැකි වීම / ප්‍රයෝජනයට නොගත් හැකියා යොදාගත හැකි වීම / ආකර්ෂණීය ලාභයක් ඉපයීම / ස්වයංපෝෂිත බව / වර්ධනය සඳහා පුද්ගලයන්ට ලැබෙන්නා වූ උපරිම අවකාශය / නිදහස හා ඉතා ඉහළ තෘප්තියකට පත්වීම (හතරක්)

(2) ඉහත සඳහන් කළ ප්‍රතිලාභයක් ප්‍රියංකාගේ ව්‍යාපාරයට අදාළකර දරුවා ඉදිරිපත් කිරීමට

(3) දේශීය සම්පත් උපයෝජනය කිරීම / ප්‍රාදේශීය සංවර්ධනය සිදුවීම / නව භාණ්ඩ හා සේවා වෙළඳපලට ඉදිරිපත් කිරීම / රැකියා අවස්ථා ජනනය කිරීම / නිමැවුම් අපනයනය කිරීම මගින් විදේශ විනිමය ඉපයීමේ හැකියාව / රටේ සමස්ථ නිෂ්පාදනය ඉහළ යාම / ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම / ආර්ථික සංවර්ධනයට දායක වීම / ස්වෛරී හා නිවහල් ආර්ථිකයක් හා සමාජයක් නිර්මාණය වීම (හතරක්)

(4) ඉහත දැක්වූ ප්‍රතිලාභයක් ප්‍රියංකාට අදාළ කර දරුවා ඉදිරිපත් කිරීමට

(5) ව්‍යවසායකත්වයෙන් හිමිවන ප්‍රතිලාභ රැකියාවක් කිරීමෙන් ලැබිය නොහැකි බව දරුවා දැක එය ඉදිරිපත් කිරීමට (2 x 5 = 10)

06 (1) සේවා නියුක්තිය වැඩිවීම / ජාතික නිෂ්පාදනය වැඩිවීම / පුද්ගලයන් අතර ආදායම් බෙදීයාමේ විෂමතාව අඩුවීම / මහා පරිමාණ ව්‍යාපාර තුළින් නොසපයන භාණ්ඩ හා සේවා සැපයීම / දේශීය දැනුම හා සම්පත් භාවිතයට ගැනීම (කරුණු හතරකට)

(2) සීමිත සම්පත් ප්‍රමාණයකින් ආරම්භ කළ හැකි වීම / පවත්නා දේශීය තාක්ෂණය වුවද භාවිතා කළ හැකි වීම / ව්‍යාපාරය පවත්වාගෙන යාමේ දී පරිසර වෙනස්වීම්වලට පහසුවෙන් අනුගත විය හැකි වීම / ව්‍යාපාර කටයුතුවල දී රජයෙන් ලැබෙන විශේෂ දිරිගැන්වීම් / සේවකයන් බඳවා ගැනීම හා පුහුණුව පහසු වීම / සේවකයන්ගේ බහුවිධ කුසලතාවලින් උපරිම ප්‍රයෝජන ගත හැකි වීම / ව්‍යාපාර කටයුතුවලට පවුලේ සාමාජිකයින්ගේ සහභාගීත්වය ලබාගත හැකි වීම / ගතික පරිසරයට ක්ෂණිකව ප්‍රතිචාර දැක්වීමේ පහසුව (හතරකට)

(3) ව්‍යාපාරයට අවශ්‍ය ප්‍රාග්ධනය රැස්කරගන්නා මාර්ග සීමා වීම / නවීන තාක්ෂණය භාවිතා නොවීම / වෙළඳපල සීමාවීම / ව්‍යාපාරික කටයුතුවලට තම පවුලේ සාමාජිකයින්ගේ මැදිහත්වීම වැඩිවීම / ව්‍යාපාරිකයාගේ දැනුම හා පළපුරුද්ද සීමා වීම (දෙකකට)

(4) මුදල් කටයුතු පාලනය දුර්වල වීම / තරගකාරීත්වයට මුහුණ දීමට අපහසු වීම / ව්‍යාපාරික කටයුතු සැලසුම් වලින් තොර වීම / බොහෝ ව්‍යාපාරිකයින් ව්‍යාපාරිකයකු ලෙස නොසිතීම / සම්පත් නිවැරදිව පාලනය නොකිරීම / දුර්වල මානව සම්බන්ධතා / ව්‍යාපාරික කටයුතුවලට ඇති පළපුරුද්ද ප්‍රමාණවත් නොවීම (හේතු හතරකට)

(5) ව්‍යාපාරික කටයුතු සඳහා නිවැරදි සැලසුම් සැකසීම හා ඒවාට අනුව ක්‍රියා කිරීම / ප්‍රවීනයන්ගෙන් අවශ්‍ය උපදෙස් හා මගපෙන්වීම් ලබා ගැනීම / ගනුදෙනු නිවැරදිව වාර්තා කිරීම / බාහිර පරිසරයෙන් එන වෙනස්කම් හඳුනා ගැනීම හා අවශ්‍ය ප්‍රතිචාර දැක්වීම / ව්‍යාපාරිකයාගේ පෞද්ගලික ජීවිතය ව්‍යාපාරික කටයුතු වලින් වෙන්කර තිබීම / යහපත් මානව සම්බන්ධතා පවත්වා ගැනීම (දෙකකට) (2 x 5 = 10)